# ලක්දිව, දළදා පූජාවේ සමාරම්භය හා විකාශය

**ජේ.පී.ඩී. රත්නායක**

අභයගිරි ව්‍යාපෘතිය, මධ්‍යම සංස්කෘතික අරමුදල, අනුරාධපුර.

1974dammikakaru@gmail.com

ප්‍රමුඛ පද: දළදාව, පුදපූජා, මැඳුර, රජතුමා

**හැඳින්වීම**

ශ්‍රී ලාංකික බෞද්ධයින්ගේ පරම පූජනීය වස්තුව ලෙස වන්දනාමානයට පාත්‍ර වන්නේ ශ්‍රී දළදා වහන්සේයි. වර්තමානය වන විට දළදාව උදෙසා පවත්වනු ලබන පෙරහැර ලෝකවාසී බෞද්ධ අබෞද්ධ ජනතාව විසින් අගය කරනු ලබන මනස්කාන්ත දර්ශනයකි. මෙම පර්යේෂණයේ දී, මහනුවර දළදා මාළිගාවේ තැන්පත්කොට වන්දනාවට පාත්‍රවන බුදුරජාණන් වහන්සේගේ යටි වම් දළදාව ලාංකිකයන් සතු වූයේ කෙසේ ද? එය වර්තමාන මාළිගාවේ ස්ථිර ව තැන්පත් වීම දක්වා විකාශනයට පත් වූයේ කෙසේ ද? යන්න පර්යේෂණ ගැටලුව වන අතර සම්බුද්ධ පරිනිර්වාණයෙන් පසු ලාංකික බෞද්ධයන් සතු වූ දළදා වහන්සේ පරසතුරු ආක්‍රමණවලින් ආරක්ෂා කොට ක්‍රමානුකූල ව තැන්පත් කොට වන්දනාමානයට ලක් වූ ස්ථාන පිළිබඳවත්, රාජ්‍යය අනුග්‍රහය ලැබුණු ආකාරයත් සාකච්ඡා කිරීම මෙහි අරමුණ වේ.

**ක්‍රමවේදය**

පුස්තකාල පරිශීලනය, අන්තර්ජාල වෙබ් අඩවි වලින් දත්ත රැස්කිරීම, ක්ෂේත්‍ර අධ්‍යයනය, හා සම්මුඛ සාකච්ඡා මගින් පර්යේෂණයට අදාළ ව තොරතුරු රැස්කරනු ලැබේ.

**ප්‍රතිඵල හා සාකච්ඡාව**

සම්බුද්ධ පරිනිර්වාණයෙන් කලක් ගිය පසු බෞද්ධයන් අතර ආමිස පූජාව ආරම්භ වීමට පටන් ගත්තේය. මහා පරිනිබ්බාන සූත්‍රයට අනුව බුදුන් පිරිනිවීමෙන් පසු බුද්ධ ශරීරයේ කොටස් බෙදාගැනීමේ අරගලයක් මතු විය. ද්‍රෝණ බමුණාගෙන් කළ මෙම ඉල්ලීම අනුව ජනපදවාසීන් අට දෙනෙකුට හෂ්මාවශේෂ සමසේ බෙදාදෙන ලදී. (දී.නි. 125) බුදුන් වහන්සේගේ සතර දළදාවන්ගෙන් එක් දාඨාවක් කළිඟු රට බ්‍රහ්මදත්ත රජු අතට පත් වූ අතර ක්‍රි.පූ. 300 දී පමණ එරට වැසියන් විසින් එයට පූජා පවත්වා ඇත. එය ප්‍රථම දළදා පූජාවයි. දළදා වහන්සේ එදා පටන් අද දක්වා රාජ්‍යය අනුග්‍රහය ලබමින් පුද පූජාවලට ලක්වූවා පමණක් නොව ලක්දිව දළදා මාළිගාවේ ආරම්භය හා පෙරහැර චාරිත්‍රවල සම්භවය ද සහිත ව මේ දක්වා අඛණ්ඩ ව පැවත එන්නේ ය. කළිඟු රට ගුහසීව රාජ්‍යය කාලයේ ඇති වූ සතුරු ආක්‍රමණ වලින් දළදා වහන්සේ ආරක්ෂා කර

ගැනීම සඳහා එම රජතුමා තම දියණිය හේමමාලා හා දන්ත කුමරු දළඳ වහන්සේ සමග දඹදිව තාම්‍රලිප්ත වරායෙන් ලක්දිව බලා නැව් නංගවා ඇත. දළඳ ඉතිහාසයට අනුව දළඳා වහන්සේ මුහුද මැද දී සෘද්ධි ප්‍රාතිහාර්යය පෑ බව ද සඳහන් වේ. ලක්දිව ලංකාපට්ටනය හෙවත් වර්තමාන ඉලංකෙයිතුරෙයි නැමති ස්ථානයට ඔවුන් ගොඩබැස තිබේ.

මහසෙන් රජ පුත් කිත්සිරිමෙවන් (ක්‍රි.ව. 301-328) රජුගේ නවවෙනි රාජ්‍යය වර්ෂයේ (ම.ව.37:92) දළඳ වහන්සේ රැගත් පිරිස අනුරාධපුර මේඝගිරි විහාරයට උතුම් දළඳව භාරදීමෙන් අනතුරුව එය මාළිගාවට වඩම්මවා ධම්මචක්ක නම් ධාතු මන්දිරයක් තනවා එහි තැන්පත් කර ඇත. එද පටන් දළඳ වහන්සේගේ අයිතිය රජතුමා සතු වූ අතර ගෞරව සැළකිලි වලට ද පාත්‍ර විය. මහාවංශයට අනුව මෙම දම්සක් නැමති දළඳ මැදුර ථූපාරාමය අසල වූ බවත් එය ප්‍රථම දළඳ මන්දිරය බවත් සඳහන් වේ (ම.ව.37:93,94). කිත්සිරිමෙවන් රජතුමා විසින් දළඳ වහන්සේ වාර්ෂික ව උතුරු මේඝගිරි විහාරය හෙවත් අභයගිරි විහාරයට වැඩම කරවා පුද පූජා පැවැත්විය යුතු බවට රාජ ආඥාවක් නිකුත්කළ බව මහාවංශය තව දුරටත් පවසයි. (ම.ව.37:95,96) ක්‍රි.ව. 5 වන සියවසෙහි අභයගිරි විහාරයෙහි වැඩ සිටි චීන ජාතික ෆාහියන් හිමියන් ගේ වාර්තාවේ ද දළඳ මන්දිරය හා ඇසල මාසයේ දී පැවැත් වූ පෙරහැර සහිත දළඳ උත්සවයක් පිළිබඳ ව සවිස්තරාත්මක විස්තරයක් වේ. (පා.වා. 95,96) දළඳ මැදුරරජ මාළිගාව අසල පිහිටි බව ද, දක්වයි. (පා.වා. 94) එනම්, බුදුන් වහන්සේ ගේ දළඳව තැන්පත් කොට තිබෙන මන්දිරය ද මේ නගරයේ ම වේ. මේ දන්තධාතු මන්දිරය මුළුමනින් ම නිමවා ඇත්තේ සත් රුවණිනි. යනුවෙනි.

මේ ආකාරයට පුදසත්කාරයට පාත්‍ර වූ දළඳ වහන්සේ ලංකාවේ බලයට පත්වුණ සෑම රජ කෙනෙකු විසින් ම විශාල ධනස්කන්ධයක් වියදම් කොට දළඳව පෙරටු කොට කරනු ලැබූ පෙරහැර පැවැත්වීම හා පූජාවන් නොකඩවා සිදුකරනු ලැබිණි. දළඳ පෙරහැර පැවැත්වීමෙන් රටට සෞභාග්‍යය උදාකර ගැනීම, වැසිඵල අපේක්ෂා කිරීම ආදිය ද බලාපොරොත්තු වේ.

මිත්තසේන රජතුමා (ක්‍රි.ව.432-433) දළඳ මන්දියේ හුණු පිරියම් කොට පෙරහැර පැවැත්වීම (ම.ව.38:7) ධාතුසේන රජතුමා (ක්‍රි.ව.460-478) දළඳ මැදුර ප්‍රතිසංස්කරණය කර දළඳ කරඬුවක්, මැණික් එබ්බවූ රුස් වළල්ලක්, මැණික් වලින් කළ නෙළුම් ආදිය දන්තධාතුන් වහන්සේට පූජාකොට ගෞරව කිරීම (ම.ව. 38:70,71) ආදිය ද, iv වන මිහිඳු රජතුමාගේ කාලයේ දැවී ගිය දළඳ මැදුර පිළිසකර කිරීම ද, (ම.ව.54:45,) අභයගිරි සෙල්ලිපියට අනුව මිහිඳු රජු දළඳවට කරඬුවක් ද පූජා කිරීම ද, සිදු වී ඇත. මේ ආකාරයට කිත්සිරිමෙවන් රජ දවස සිට iv වන මිහිඳු රජු දක්වා වසර ගණනාවක් ගෞරවාදරයට පත් වූ දළඳ සමිඳුන්

අනුරාධපුර රාජධානියේ පරිහානියත් සමග පොළොන්නරුවට සංක්‍රමණය විය. ඉන්පසු දළදා වහන්සේට පොළොන්නරුව ආරක්ෂිත ස්ථානය වූ අතර එය රාජ්‍යය උරුමයේ සංකේතය බවට ද පත් විය.

සොළී පාලනයෙන් රට මුදවාගත් පළමුවන විජයබාහු රජතුමා මහාර්ඝ වූ දළදා මන්දිරයක් ඉදිකොට නිරන්තරයෙන් දළදාවට පුද පූජා පවත්වන ලදී. පොළොන්නරුවේ ශ්‍රේෂ්ඨ නරපතියෙක් වූ මහා පරාක්‍රමබාහු රජතුමා (ක්‍රි.ව. 1153-1186 ) රාජ්‍යත්වය ලබාගැනීමට අවශ්‍ය ව තිබූ දළදාව ලබාගැනීමට දීර්ඝ වශයෙන් සටන් වැදුනේ ය. රුහුණේ තිබූ දළදාව පොළොන්නරුවට ගෙන් වා පුද සත්කාර කොට පෙරහැර ද පවත් වා ඇත. මහේන්ද්‍ර නැමති ඇමති විසින් ද මනස්කාන්ත ප්‍රාසාදයක් දළදා වහන්සේ වෙනුවෙන් ඉදිකරන ලදී (ම.ව.73:131-138).

ක්‍රි.ව. 1187-1196 කාලයේ දී මෙරට පාලකයා වූ නිශ්ශංකමල්ල රජතුමා ද දළදා වහන්සේට පුද සත්කාර කොට ශෛල මන්දිරයක් ඉදිකරන ලදී. (ම.ව.80:19) පොළොන්නරු රාජධානිය බිඳවැටීමත් සමග දළදා වහන්සේට ආරක්ෂාව සැලසී ඇත්තේ කොත්මලේ දීය. (ම.ව.81:17-20) තුන්වෙනි විජයබාහු රජතුමා (ක්‍රි.ව. 1232-1236) දඹදෙණියෙහි තම රාජ්‍යත්වය ආගමෙන් හා නීතියෙන් අනුමතකරවා ගැනීමට දළදා වහන්සේ කොත්මලේ සිට මහ පෙරහරින් දඹදෙණියට වැඩමවා බෙලිගල පර්වත මස්තකයේ මනහර දළදා මැදුරක් ඉදිකොට පුද පූජා පවත්වන ලදී (ම.ව.81:34-38).

දඹදෙණි රාජ්‍යය කාලයේ ශ්‍රේෂ්ඨ පඬිවරයෙක් වූ කලිකාල සාහිත්‍යය සර්වඥ පරාක්‍රමබාහු (ක්‍රි.ව.1281-1293) රජු හය මසක් මුළුල්ලේ දළදා පෙරහැර හා පූජා පැවැත් වූ බවත් දළදා වහන්සේට ඉහළම පූජා ලැබුණේ මෙකල බවත් ඉතිහාසගත තොරතුරකි. (ම.ව. 87:70-75) මෙතුමා විසින් බෙලිගල පර්වතයේ වූ දළදා මාළිගාව වෙනුවට දඹදෙණි පර්වතය මත දළදා මැදුරක් නිර්මාණය කරන ලදී.

කුරුණෑගල රජකළ භුවනෙකබාහු රජතුමා විසින් රජ ගෙදර චිත්‍ර කර්මාදියෙන් විචිත්‍ර වූ දළදා මාලිගාවක් කරවා දළදාවට පුද සත්කාර කිරීම හා පණ්ඩිත පරාක්‍රමබාහු රජු තුන්මහල් දළදා පහය කරවීමත්, දඨාධාතු ග්‍රන්ථය කරවීමත්, ඔහු විසින් දළදා වහන්සේ වෙනුවෙන් කෙත්වතු හා පිරිවර ජනයා පිරිනැමීමත්, සිදුකරන ලදී. (ම.ව.90 :67-80)

ඉහත දක් වූ ආකාරයට පුද පූජා වලට බඳුන් වූ දළදා වහන්සේ මහනුවරට වැඩම කරවීමට ප්‍රථම කුරුවිට දෙල්ගමු ව රජමහා විහාරස්ථානයෙහි වඩා හිඳුවා ආරක්ෂාව සලස්වා ඇත. රජතුමාත් සමග ම රාජධානියෙන් රාජධානියට වැඩම කරවනු ලැබූ දළදා වහන්සේ පළමුවන විමලධර්මසූරිය රජතුමා විසින් මහනුවරට වැඩම කොට පළමු වන දින රාත්‍රියේ මහනුවර අස්ගිරි ගෙඩිගේ විහාරස්ථානයෙහි තැන්පත්

කරන ලදී. (ක්‍රි.ව. 1593-1604) ඉන්පසු වර්තමාන දළදාමාළිගාව අසල ඉදි කළ මැදුරක දළදාව තැන්පත් කොට පූජා පවත්වන ලදී. දෙ වැනි විමලධර්මසූරිය, නරේන්ද්‍රසිංහ, කීර්ති ශ්‍රී රාජසිංහ, ශ්‍රී වික්‍රමරාජසිංහ යන නරපතීන් විසින් විවිධ අවස්ථාවල වර්තමාන දළදා මන්දිරය ප්‍රතිසංස්කරණ රාශියකට ලක්කරන ලද අතර මෑත කාලීන ව සිදු වූ කොටි ත්‍රස්තවාදී ප්‍රහාරයෙන් පසුව ද වර්තමානයේ ඇති තත්ත්වයට ප්‍රතිසංස්කරණය සිදු වී ඇත.

ඉහත සඳහන් පරිදි ආරම්භයේ පටන් වර්තමානය දක්වා ඉමහත් ගෞරවාදරයට පාත්‍ර වෙමින් පුද සත්කාර හා පෙරහැර ආදියට නිරන්තරයෙන් පත් වූ දළදා වහන්සේ 1988 වර්ෂයේ දී ලෝක උරුමයක් බවට පත් ව දෙස් විදෙස් සංචාරක බැතිමතුන්ගේ ගෞරව භක්ත්‍යාදරයට පත් ව තිබේ.

**ආශ්‍රිත ග්‍රන්ථ**

බළන්ගොඩ ආනන්ද මෛත්‍රෙය මහානායක ස්ථවිරයන්, (පරි) (2004) දීඝනිකාය, ද්විතීය භාගය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, කොළඹ.

සුමංගල හික්කඩුවේ ශ්‍රී සහ දේවරක්ෂිත බටුවන්තුඩාවේ, (සංස්) (2014) මහාවංශය ද්විතීයභාගය, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්) සමාගම, කොළඹ.

බලගල්ල, විමල් ජී. (පරි) (1999) ෆාහියන්ගේ දේශාටන වාර්තාව, විසිදුණු ප්‍රකාශකයෝ, බොරලැස්ගමුව.